
Page 8 February 2012 .qxd 15/02/2012 20:35 Page 1



## කවි කොළය



# මිනීකන දරුවෝ!

අවුරුදු පහලොවේ කොලුගැටයෙකි තාම
විසි නම වියැති ළඳකට උගෙ මව සේම
වද දී දරුණු පහරින් යුද වැද කාම
දිවි තොර කළා එළිවෙන්නට පෙර රෑම

මේ අමනයා ඈ සිහිසුන් වන තුරුම
යෙදෙමින් මෙසේ අවකල් කිරියෙහි නරුම
මළ බව සිතා ඈ නවතා වෙර දැරුම
සිදුකොට තිබේ තැතිගෙන මේ මිනි මැරුම

ඈ පණපිටින් ඇදගෙන ගොස් දුර ඈත
දියපිරි වලක දා - සෝදා ලේ දෑත
මේ අධමයා කළ පසු කරුමය ගෝත
හොර පූසෙකු වගේ හැසිරුණි ළඟ පාත

මත්කුඩු පහර පොරකන ලේ නහර දිගේ
පණ ගැන්වීද ජව බල අඟපසඟ උගේ
පාසැල් වියේ පසුවන දරුවෙකුගෙ ඇඟේ
මෙතරම් වෙරක් වෙත්දැයි මොහොතකට හැඟේ

ඉහළම කලා නිපැයුම් යයි හඳුන් වන
කාමුක හැඟුම් සිනමා පටිවලින් දෙන
මොබයිල් කණ ගසාගෙන යන ළමුන් ගැන
විමසා බැලිය යුතු මුල සිට පටන් ගෙන

ටී.වී. නාලිකාවල උතුරයි කාමේ
කොල්ලා අවදි වෙයි රෑ නිදියන ජාමේ
කය පිනවීම වී ඇත. ආලයෙ පේමේ
නාකින්ටත් හැදෙයි පිස්සුව පැණි කෑමේ

කප්පන් කෙළි කෙළිති පාසැල් යන කොල්ලෝ
කුඩු බී නටති ලොකු විදුහල්වල කෙල්ලෝ
පන්සල් වලත් නිදහන් භාරති බල්ලෝ
එල්ලුම් ගහ නොමැත නැත අද යම පල්ලෝ

දරුවන් නොහඬවා ගෙයි
බත ඉදියන්
පෑගෙන තැලෙන වුන්ගේ
දුක මිදියන්
රට කන වුන්ට හෙණපිට
හෙණ වැදියන්
රිදුනොත් රිදෙන තැනකට
මෙය රිදියන්



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## නිදන් හොරු පරගොඩ රජමහා විහාරය වනසති වසර 300ක් පැරණි බුදුපිළිමයේ හිස කඩලා

ඓතිහාසික වටිනාකම් රැසකින් යුක්ත ගාල්ලේ ඉමදුව පරගොඩ රජ මහා විහාරයේ තිබූ වසර 300 කට වඩා පැරණි බුදු පිළිමයෙහි හිසකඩා විනාශකර එහිවූ නිදන්වස්තු රැගෙන ගොස් ඇත. මෙය වූයේ ජනවාරි 27 වන සිකුරාදා මධ්‍යම රාත්‍රියේය.

මෙම හොරු කිසිවෙකු මේ වන තුරු අත් අඩංගුවට ගෙන නොමැත. කෙසේ නමුත් ඊට දින කීපයකට පෙර වෙළෙන්දන් කීපදෙනෙකු පන්සලේ රාත්‍රියේ නවාතැන් ගත්බව කියති. මෙම විහාරස්ථානයේ කපු මහතා නම් කියන්නේ මෙය සැලැස්මක් ඇතිව කරන ලද්දක් බවයි.

විහාරාධිපති හිමියන් එදින ඈත ගමනක් ගොස් සිටි බව කියැවේ. මෙහි නායකත්වයට දැනට නඩුවක්ද පැවරී තිබේ. පන්සලේ ආරක්ෂාව ගැන නොතකා පිටින් එන බොහෝ අයට රාත්‍රියෙහි එහි නතරවන්නට ඉඩ ලැබෙන බවද කපු මහතා කියයි.

## වයස 15 පාසැල් සිසුවෙකුගේ වැඩක්

# තරුණ එක් දරු මවකගේ සිරුර පාලු ළිඳක....

පසුගිය මස වව්නියාව පෙරිය උළුක්කුලම ජනඋදාන ගම්මා-නයේ පදිංචිව සිටි 29 හැවිරැදි විමලා රන්ජනී හෙවත් මේනුකා නමැති කාන්තාව මියගොස් ඇත්තේ ඉතා ඛේද ජනක විදියටය. එම ශෝකී පුවතින් ඒ පළාතම සසළ විය.

මේනුකාගේ පවුලේ තිදෙනෙකි. ඒ ඇය, සැමියා සහ දියණියයි. ඔව්හු ඉතා සතුටින් සාමකාමී පවුලක් ලෙස ජීවත් වූහ.

මේනුකාගේ සැමියා වන සුමිත් අමරසිංහ සිවිල් ආරක්ෂක බලකායේ සෙබළෙකි. රැකියාවට අමතරව එම පළාතේම කුඹුරක් අස්වැද්දීමෙන්ද ඔහු තම පවුල නඩත්තුකිරීමට අවශ්‍ය ආදායම සොයාගත්තේය.

මේනුකා ගිය මස 19 වනදා උයද වරුවේ කුඹුරට ගියේ එයට වතුර හැරවීමටය. එදා ඇයගේ සැමියා කිසියම් රාජකාරි කට යුත්තකට මිහින්තලයට ගොස් තිබුණේය. එම කුඹුරද එහි වට පිටාවද මේනුකාට හොඳට හුරු පුරුදුය. කිසිදු අනතුරක් ඒ වට පිටාවේ සිදු වෙන්නට බැරිය. එහෙත් එය එසේ වී නැති බව පෙනේ. එදින ඇය ආපසු ගෙදර ආවේ නැත.

මේනුකාගේ සැමියා සුමිත් අමරසිංහ ගෙදර පැමිණියේ රාත්‍රීයේය. ඔහු මෙන්ම අසල් වැසියන්ද ඒ රැයේ ඇය සොයා ගිය මුත් කිසිදු හෝඩුවාවක් නොවීය.

පසුදා එනම් 20 වන දා අලුයම සෙවීමේ කටයුතු ආරම්භ වීය. ඊට උළුක්කුලම පොලිස් මුර පළේ නිලධාරීහුද එක්වූහ. ඔවුන්ට ඇය හමුවිය. ඒ ඇගේ අත් පා ගැටගසා නිරුවතින් වතුර පිරි පාළු ළිඳකට දමා තිබුණු ඇගේ නිසල සිරුරය. හිසට දරුණු ලෙස පහරදී තිබුණු බව පෙනිණ. එසේම ඒ සිරුර පුරාම කිසිවෙකු විසින් දරුණු ලෙස සපාකන ලද දත් පාරවල් හොඳින් පෙනෙන්නට විය.

පෙනිණ. එසේම ඒ සිරුර පුරාම කිසිවෙකු විසින් දරුණු ලෙස සපාකන ලද දත් පාර වල් හොඳින් පෙනෙන්නට වීය.

එම පළාත අයිති සෙට්ටිකුලම පොලිස් වැයික්කියටය. මරණය පිළිබඳ පොලිස් පරීක්ෂණ වහා ආරම්භ විය. පොලිස් නිලධරීහුද පොලිස් සුනඛයෝද යුහුසුළු වූහ. මුලින් මේනුකා ගේ ලේ තැවරුණු ඇඳුම් සඟවා තිබු තැනින් සොයාගන්නට ඔවුනට හැකි විය. ඉන් අනතුරු ඒ ඔස්සේ කළ පරීක්ෂණ අවසානයේ ඝාතන සැකකරුද සොයාගන් නට පොලිසියට හැකිවිය. ඔහු සුගත් නමැති 15 හැවිරිදි පාසැල් ශිෂ්‍යයෙකි. එම ජනපදයේම පාසැලක ඉගෙනුම ලබන්නෙකි. ඒ අසළ නිව සක 71 හැවිරිදි පුද්ගල යෙකුද සැකපිටඅත්අඩංගුවට ගැනිණ.

සැකකාර ශිෂ්‍යයාගෙන් දිගටම ප්‍රශ්න කිරීමේදී ඔහු එළිදරව් කළදේ මේ ය.

මේනුකා වතුර හරවන්නට කුඹුරට ගිහින් හිටි වෙලේ තමා ද තම පවුලේ කුඹුරට වතුර හැරවීමට ගිය බවත් ඇය දැකීමෙන් තමා තුළ ආශාවක් ඇතිවූ බැවින් ඇය බිම පෙරලාගෙන දූෂණය කළ බවත් එහිදී ඇයට සිහි නැතිවූ බවත්ය. "පස්සෙ මම ඇයව කකුල් දෙකෙන් ඇදගෙන ගිහින් පාලු ළිඳට දැම්මා....... එහිදී මේනුකාට සිහිය ආවා....... එතකොට මම ඇයව මැරෙන කල් වතුරෙ ඔබාගෙන හිටියා......". ඔහු පොලීසියට පැවසීය.

කෙසේ වෙතත් සැකකරු පවසනවාට වඩා කාන්තාවට ඉමහත් වධ දී ඇති බව පොලිසිය කියයි. පහරදීම් හා සිරුරේ සපාකෑම් ආදි සිදුකර ඇත්තේ සිහි විකල් වූවෙකු පරිද්දෙනි. සැකකරු ශිෂ්‍යයා මත්බෙහෙත් වලට ඇබ්බැහි වූවෙකුද යන්න තව දුරටත් පරීක්ෂා කෙරේ. දැනට සැක කරුවන් දෙදෙන රිමාන්ඩ් භාරයේ පසුවෙති.

*( වව්නියාව දිනමිණ සමූහ වාර්තාකරු )*

## මොරටුවේ සිසුන් දෙදෙනෙක් පාසැල් දැරිය මරාදමන බව කියා රු: ලක්ෂ 3ක් කප්පම් ඉල්ලති!

මොරටුවේ රාවතාවත්තේ ප්‍රධාන පාසැලක මෙවර අපොස විභාගයට පෙනී සිටි ශිෂ්‍යයින් දෙදෙනෙකු එම පෙදෙසේම වෙනත් පාසැලක සිසුවියක් මරාදමන බවට ඇයගේ දෙමාපියන්ට තර්ජනය කර එසේ නොකිරීමට නම් රුපියල් ලක්ෂ 3 ක මුදලක් ඉල්ලා ඇති අතර එය ලබාගැනීමට ඔවුන් දෙදෙන උත්සාහකරද්දී වෙස්වලාගත් පොලිස් නිලධාරීන්ට එම 17 වියැති ශිෂ්‍යයින් දෙදෙන අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත.

දැරිය මරා දමන්නට තමන්ට ඉහළින් අණක් ලැබී ඇති බවත්, එසේ නොකිරීමට නම් රුපියල් ලක්ෂ 3 ක මුදලක් දෙන ලෙසත්, මේ පිළිබඳව පොලීසියට හෝ වෙනත් කිසිවෙකුට දැන් වුව හොත් දැරියගේ ජීවිතය අහිමිවීමට ඉඩ ඇති බවත් මෙම සැක කාර ශිෂ්‍යයින් දෙදෙන වරින් වර එම දැරියගේ දෙමව්පියන්ට දුරකතනයෙන් දැනුම් දී තිබේ.

දෙමව්පියෝ මේ බව ගල්කිස්ස පොලිස් අධිකාරි කාර්යාලයට දැනුම්දුන්හ. පොලීසියේ උපදෙස් මත දෙමව්පියන් කප්පම්කරු-වන්ට පිළිතුරුදී ඇත. එනම්, අදාළ කප්පම් මුදල දීමට එකඟවන බවත්, එය ගැනීමට ලුනාව කලපුව අසළට රාත්‍රී 12 ට පැමිණෙන ලෙසත්ය. ඒ අනුව ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීහු වෙස් වලාගෙන එම ස්ථානයේ රැක සිට කප්පම් මුදල් ලබාගැනීමත් සමග සැකකරුවන් දෙදෙන අත්අඩංගුවට ගැනීමට සමත්වූහ.

ගල්කිස්ස පොලිස් අධිකාරී රවීන්ද්‍ර කරවිට මහතාගේ අධීක්ෂණය යටතේ ගල්කිස්ස පොලිස් මූලස්ථාන පොලිස් පරීක්ෂක කමල් පුෂ්පකුමාර මහතාගේ උපදෙස් මත කුමාර නලවංශ, ටෙරන්ස්, හර්ෂණ, පුබුදු, සම්පත්, පුෂ්පා සහ මහේෂිකා යන ගල්කිස්ස ඒකකයේ පොලිස් නිලධාරීන් හා නිලධාරිනියන් එක්ව මේ වැටලීම සාර්ථකව සිදුකර ඇත.

♦ පින්සිරි ආරියරත්න (දිවයින)



**ඉරිදා** - හරි පුදුමයි දැන් මෙන්න පෙබරවාරි මාසෙත් ආවා.
**SUN** කෝ හිම? කෝ ස්නෝ? එච්චර හීතලකුත් නැහැ. මං හිතන්නෙ මේපාර තමයි ඉතිහාසෙ පළමු වතාවට වින්-ටර් එකේ එංගලන්තෙට හිම වැටුනෙ නැත්තෙ. වෙන අවුරුදුවල අම්මෝ! දෙසැම්බර් ඉඳලා හිම වැටෙනවා. හීටිං දාලත් ගේ ඇතුළෙ ඉන්න බැරි තරම් හීතල. නාලිනී ඒ කාලෙට විනාඩි පහෙන් පහට කියන්නෙ අනේ! ලංකා-වට දුවන්න හිතෙනවා කියලා. මෙහෙම හිත හිත ඉන්න කොට මෙන්න බොලේ අද BBC නිවුස්වලට කිව්වා ඉතිහාසෙ දරුම වින්ටර් එකට ලෑස්ති වෙන්න..... දනක් උසට අයිස් වැටෙනවා.....ලබන සතියෙ මේ දරුණු හීතල හුළඟ එන්නෙ රුසියාවෙ සයිබීරියාවෙ ඉඳලා. උශ්ණත්-වය -24 ට බහිනවා. දැන් බ්‍රිතාන්‍යයේ හමුදාවලටත් අණ දීගෙන යනවා ලෑස්තිවෙලා ඉන්න කියලා. මගේ හිතේ සංතෝසෙත් - 0 ට බැස්සා. ලෝකෙ හැටි!

**සඳුදා** - ඊයෙ අපි හැමර්ස්මිත්වලට යද්දි මෙට්රෝපොලිටන්
**MON** පොලීසියෙ අළුත් වැඩක් දැක්කා. දිග පොලිස් වෑන් එකක බොඩි එකේ දෙපැත්තෙ ගහපු කටවුට් දෙකක අලවපු ලොකු පින්තූර වගයක්. ඒ පින්තූරවල ඉන්නෙ දැනට හැංගිලා ඉන්න අපරාධකරයින්ගෙ නමත් එක්ක මූණු. අල්ලලා දුන්නොත් හෝ ඉන්න තැනක හෝඩුවා වක් කිව්වොත් විසාල මුදල් තෑගි දෙන බවටත් දැන්වීමක් පොලීසියෙන් බෙදුවා. වෑන් එක පාරෙ හරී හෙමින් ගියේ. එතකොට පාරෙ යන අයට මූණවල් නෝට්කර ගන්න පුළුවන්. අපරාධ මර්දනයට ඒ එක පියවරක්. අපරාධකාරයින්ට මීට පස්සෙ පාරෙ යන්න වෙන්නෙ ඉතින් වෙසක් මූණක් දාගෙන තමයි.

**කුජදා** - කැතරින් කුඩම්මා කාලයක් තිස්සෙ කියනවා
**TUE** එයාට ඔලුව කළු කරගන්න එංගලන්තෙන් හොඳ හෙයාර් ඩයි එකක් එවන්න කියලා. මම අපේ නිහාල්ට කිව්වා. නිහාල් දෙනවත් වෙලා හොඳඑකක් දෙන්න ඕන කියලා බූට්ස් ලගෙන් පවුම් 35 කට ඩයි එකක් ගෙනැත් කුඩම්මට යැව්වා. ඒක ගාන පිළිවෙලත් කියලා ඇරියා. කුඩම්ම ඒ ඩයි ගාලා, සුදු ඇඳලා, බාප්පත් එක්ක කවුද ළඟම නෑයෙකුගෙ මරණෙ ගෙදරක ගිහිල්ලා. කුඩම්මා මළ ගෙවල්වල අඬන්න රුසියා. පෙට්ටියෙ මිනිය දිහා බල බල, එතන ගෑණු කීපදෙනෙක් බදාගෙන කුඩම්මා අඬලා. පස්සෙ තමයි දැක්කෙ, අර ගෑණුන්ගෙ සුදු සාරි හැට්ටවල කුඩම්මගෙ ඩයි ගෑවිලා. දැලිම දැලි පාටලු උන් හරියට ලිපළඟ ඉඳලා ආව වගේ. දැන් කුඩම්මා අපිට දොස් කියනවලු බාල ඩයි ජාතියක් එව්වයි කියලා.

**බුදදා** - ලංකාවෙ හැම දෙයක්ම පහත බහින හැටි හොඳින්
**WED** පේනවා. අධ්‍යාපනය ගන්න දෙයක් නෑ. පාසැල් ළමයින්ගෙ හැසිරීමෙ ගන්නදෙයක් නෑ. ළමයි දැන් මහ තක්කඩි වැඩ කරන්නෙ. කොළඹට කිට්ටු ඉස්කෝලෙ යන ළමයි දෙන්නෙක් ගෙදරකට ටෙලිපෝන් කරලා රුපියල් ලක්ෂ දෙකක් කප්පම් ඉල්ලලා. කියලා තියනවා දුන්නෙ නැතිවුනොත් ඒ ගෙදර ඉන්න පොඩි දරුවව හොරකම්කරන් යනවා කියලා. පොලීසියෙන් උන් දෙන්නා අල්ලගෙන. තව පළාතක අවුරුදු 15 ක ඉස්-කෝලෙ යන කොල්ලෙක් දරුවොත් ඉන්න ගෑණු කෙනෙක්ව දූෂණය කරලා, පස්සෙ ඒ ගෑණු කෙනාව මරලා ඇදගෙන ගිහින් වතුර වළක දාලා. මුන් ළමයිද? මේ නම් අපි දැනගන හිටි ලංකාව නෙවෙයි.

**ගුරුදා** - ලන්ඩන් වල ඉන්න සමහර සිංහළ පවුල්වල අය
**THU** හිතනවා තමන්ගෙ දරුවො ලංකාවට පිටත් කරලා එහේ ඉන්ටර් නැෂනල් ඉස්කෝලවල දාන්න. එහෙම හිතන්නෙ ළමයින්ට හොඳ සිංහළ සිරිත් විරිත් පුරුදු කරන්නයි සදාචාරය අනුව හදන්නයි කියලා එහේ ඉන්න මාමලා නැන්දලා ඒ ළමයි හොඳින් බලාගන්නවා කියල පොරොන්දු වුනාලු. මම ඒ අයට කිව්වා ළමයින්ට ආදරයක් තියනව නම් ඒ ගොන් වැඩේ කරන්න එපා කියලා. ලංකාවෙ පාසැල් ළමයි කරන දේවල් හරි හැටි ඒ මාමලා නැන්දලා දන්නවද? බම්බුව තමයි දන්නෙ!

**කිවිදා** - අන් ලංකාවෙ වැඩිපුරම කතාව තමයි 13 වෙනි
**FRI** සංශෝධනය. ඒ අනුව දෙමළ සංධානෙ උතුරු නැගණහිර පළාත්පාලන ආයතන වලට පොලිස් බලතල සහ ආයුධ පරිහරණය ඉල්ලනවා. ඉන්දියාවටත් කියනවා අනේ කොහොම හරි ඒක ලෑස්තිකරලා දෙන්න කියලා. මේ LTTE එක වෙන විදියකට ආයිත් එන්නයි හදන්නෙ. තවම කියන්නෙ අර පරණ කතාවමයි. දෙමළ මිනිස්සු-න්ගෙ ප්‍රශ්නවලට තවම විසඳුමක් ලැබිලා නැතිලු. මොනවද ඒ ප්‍රශ්න කියලා ඇහුවට කියන්නෙත් නෑ.

**ශනිදා** - වහෙන් ඔරෝ බාසාව නැතුව කෙලින්ම මේ දිහා
**SAT** බැලුවොත් TNA ඇතුළු දෙමළ ඩයස්පෝරාවට තවමත් ඕන උතුරු නැගණහිර වෙන්කරලා ඒකෙ ඊළම් රාජ්‍යය හදන්න. සිංහළයින් හුඟක් දෙනෙකුට ඊට කාපුවා උදේට මතක නෑ. පහුගිය කාලෙ යුද්ධ කරපු හැටි අපේ සමහර සිංහළ අයට දැන් මතක නැතිවේගන යනවා වගේ පේන වා. සිංහළ ආණ්ඩු ගොනාට අන්දවන්න හරි ලේසිය කියලයි ඒ කාලෙ ඉඳලම දෙමළ අය හිතන්නෙ. ඒ හිතන දේ එක අතකට වැරදි නෑ කියලා මට දැන් පේනවා.